කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : 04
වර්ණය : ඇම්බර්

WW/TC/19/11/08/04

# තද වැසි, තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිළිබඳ විශේෂ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2019 නොවැම්බර් මස 08 වන දින ප.ව. 02.00 නිකුත් කරන ලදී.

## බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ ධීවර සහ නාවුක කටයුතු වල යෙදී සිටින ප්‍රජාව සඳහා

**සැලකිලිමත් වන්න!**

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති “බුල්බුල්” චණ්ඩ සුළි කුණාටුව මේ වනවිට, ඉතා චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඇති අතර දැන් එය, උතුරු අක්ෂාංශ 17.2 ත් නැගෙනහිර දේශාංශ 87.6 ත් ආසන්නයේ පවතී. එය ඉදිරි පැය 24 තුළ තවදුරටත් වර්ධනය වෙමින් උතුරු දෙසට ගමන්කර ඉන්දියාවේ බටහිර බෙංගාල සහ බංගලාදේශ වෙරළ දෙසට ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.

උතුරු අක්ෂාංශ 15ත් 22ත් සහ නැගෙනහිර දේශාංශ 83ත් 94ත් අතර මුහුදු ප්‍රදේශවල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඉතා තද සුළං සමඟ මුහුදු ප්‍රදේශ දළ රළු විය හැක. නොවැම්බර් 11 වනදා දක්වා නාවික හා ධීවර ප්‍රජාවට (විශේෂයෙන්ම බහුදින ධීවර යාත්‍රාවලට) ඉහත මුහුදු ප්‍රදේශවලට යාත්‍රා නොකරන ලෙසට උපදෙස් දෙනු ලබන අතර මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ

**අනාවැකිය:**

උතුරු අක්ෂාංශ 15.0 ත් 22.0 ත් නැගෙනහිර දේශාංශ 84.0 ත් 95.0 ත් අතර බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි.ද පැ.කි.මී. 80-100 පමණ වන සුළං සහ විටින් විට පැ.කි.මී. 120-130 දක්වා ඉතා තද සුළං ඇති විය හැකි අතර මුහුදේ ස්වභාවය “දළ රළු” සිට "ඉතා දළ රළු" දක්වා වැඩි විය හැක.




"බුල්බුල්" සුළි කුණාටුවේ ගමන් මාර්ගය පිළිබඳ අනාවැකිය

මූලාශ්‍රය - RSMC


EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/11/08
Time : 14:35 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE


මීළඟ නිවේදනය 2019.11.09 දින ප.ව 02.00 ට නිකුත් කෙරේ.

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **04**
COLOR: **Amber**

WW/TC/19/11/08/04

# Special Advisory for Heavy rain, Strong winds and Rough seas

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 02.00 p.m. 08th November 2019

## For Naval and Fishing Community in the Bay of Bengal Sea Area

### PLEASE BE AWARE!

**The severe cyclonic storm "Bulbul" in the Bay of Bengal sea area has developed into a very severe cyclonic storm and now located near latitude 17.2N, longitude 87.6E. It is very likely to intensify further during next 24 hours and move northwards, towards west Bengal (India) and Bangladesh coast.**

**Heavy showers or thundershowers, very strong winds and high seas can be expected in the sea areas between latitude 15N and 22N, longitude 83E and 94E. Naval and fishing communities (particularly multiday boats) are advised not to venture into above sea areas and requested to be vigilant in this regards till 11th November.**

### Forecast:

**Intermittent showers or thundershowers, strong winds 80-100 kmph & gusting up to 120-130 kmph at times and high to very high seas can be expected over warning area (latitudes 15.0$^0$N to 22.0$^0$N and longitudes 84.0$^0$E to 95.0$^0$E).**




Forecast track for Cyclonic storm "Bulbul"

Source - **RSMC**

**The next bulletin will be issued at 2.00 p.m. at 09th November 2019.**